# ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

## වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශනය

### 2015 ජනවාරි 01 - 2015 දෙසැම්බර් 31

2 - CM 025095 — 100 (2017/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය,
අංක 155/15, කාසල් වීදිය,
කොළඹ 08.

ගරු පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය ඇමතිතුමා,
පර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,
අංක 163, කිරුළපන මාවත,
පොල්හේන්ගොඩ,
කොළඹ 05.

ගරු ඇමතිතුමනි,

## වාර්ෂික වාර්තාව - 2015

1973 අංක 5 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනතේ 20 වැනි වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වැනි වගන්තිය අනුව ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ පහත සඳහන් වාර්තා ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි.

01. 2015 ජනවාරි මස 01 වැනි දින සිට 2015 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා මණ්ඩලයෙන් ඉටු කෙරුණ කාර්යභාරය;

02. විගණකාධිපතිගේ වාර්තාව;

03. එම කාලපරිච්ඡේදය සඳහා අවසන් ගිණුම් ප්‍රකාශනයේ පිටපතක්.

මෙයට,
විශ්වාසී,

අධිනීතිඥ කොක්ගල වෙල්ලාල බන්දුල,
සභාපති.



3 - CM 025095

# ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ වාර්ෂික වාර්තාව – 2015 කෙටුම්පතකි

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

1973 අංක 5 දරන පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යවස්ථාපිත මණ්ඩලයකි.

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය පිහිටුවීමේ අපේක්ෂාව වූයේ

(i) ශ්‍රී ලංකාවේ පුවත්පත්වල නිදහස ආරක්ෂා කිරීම
(ii) එම නිදහසින් අයුතු ප්‍රයෝජන ගැනීම වලක්වාලීම
(iii) සත්‍ය තොරතුරු දැන ගැනීමේ ජනතා අයිතිය තහවුරු කිරීමත් ය.

2012.01.01 වැනි දින සිට අංක 155/15, කාසල් වීදිය, බොරැල්ල, කොළඹ 08 ස්ථානයේ පවත්වාගෙන යනු ලැබිය.

**01. මණ්ඩලයේ සැකැස්ම**

අර්ධ අධිකරණමය කාර්ය භාරයක් ඉටු කරන පුවත්පත් මණ්ඩලය සාමාජිකයන් හත්දෙනෙකුගෙන් (07) සමන්විත වේ. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ (වර්තමානයේ අධ්‍යක්ෂ ජනරාල්) නිල බලයෙන් මණ්ඩලයේ සාමාජිකත්වය ලබයි. සාමාජිකයින් හයදෙනෙකු පත් කිරීම සිදු වන්නේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිතුමා විසිනි. ඉන් එක් තැනැත්තෙකු ක්‍රියාකාරී පත්‍ර කලාවේදීන් නියෝජනය කරන තැනැත්තෙකු විය යුතු අතර, තවත් සාමාජිකයෙකු පුවත්පත් ව්‍යාපාරයේ සේවකයන්ගේ සම්බන්ධතා නියෝජනය කරන තැනැත්තෙකුගෙන් සමන්විත වේ. පත් කරනු ලබන දින සිට සාමාජිකයන්ගේ නිල කාලය වසර 03 කි.

අතිගරු ජනාධිපතිතුමන් විසින් 2015.06.14 වැනි දින සිට පත්කරන ලද මණ්ඩලයේ සභාපති හා සාමාජිකත්වයේ නාම ලේඛනය පහත පරිදි විය:-

| **තනතුර** | **නම** | **පත්වූ දිනය** |
|---|---|---|
| සභාපති | අධිනීතිඥ කොග්ගල වෙල්ලාල බන්දුල මහතා | 2015.06.14 |
| සාමාජික | ආචාර්ය දර්ශනී ගුණතිලක මිය | 2015.06.14 |
| සාමාජික | මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර මහතා | 2015.06.14 |
| සාමාජික | මහාචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදස මහතා | 2015.06.14 |
| සාමාජික | ආරියනන්ද දොඹගහවත්ත මහතා | 2015.06.14 |
| සාමාජික | ගාමිණී සුමනසේකර මහතා | 2015.06.14 |

සාමාජික ප්‍රදීප විජේසුන්දර මහතාගේ නිල කාලය 2014.09.05 වැනි දිනෙන් අවසන් වූ අතර, ඒ වෙනුවට සාමාජික එස්. තිලෙයිනාදන් මහතා 2014.10.21 දින පත් කරන ලදී.

**02. මණ්ඩලයේ රැස්වීම්**

2015.06.14 වැනි දින තෙක් අධ්‍යක්ෂ මණ්ඩලය පත් නොවී තිබූ බැවින් මණ්ඩලයට පැමිණිලි විභාග කිරීමේ හැකියාවක් නොවූ බැවින් 2015.07.15 වැනි දින සිට පුවත්පත් පැමිණිලි විභාග කරන ලදී. මෙහිදී සහභාගි වූ රැස්වීම් වාර ගණන 11කි.

**03. පැමිණිලි**

2015 වර්ෂය තුළ දී ප්‍රවෘත්ති පත්‍රවලට විරුද්ධව පැමිණිලි පිළිබඳ විභාග 24ක් ලැබී තිබුණි. මෙම පැමිණිලි 24න් පුවත්පත් මණ්ඩල පනතට අනුකූල නොවන පැමිණිලි 6ක් ලැබී තිබුණි.

එසේම 2013 හා 2014 වසරවලින් 2015 වර්ෂයට ඉදිරියට ගෙනෙන ලද මණ්ඩලයට ක්‍රියාමාර්ග ගැනීමට ඇති පැමිණිලි සංඛ්‍යාව පිළිවෙලින් 07ක් හා 27ක් වේ.

| | |
|---|---|
| 2013 වර්ෂයෙන් ඉදිරියට ගෙනා පැමිණිලි ගණන | - 07 |
| 2014 වර්ෂයෙන් ඉදිරියට ගෙනා පැමිණිලි ගණන | - 27 |
| 2015 වසරේ ලද පැමිණිලි ගණන | - 18 |
| 2015 වසරේ විභාග කළ මුළු පැමිණිලි ගණන | 52 |

එසේ ලද පැමිණිලිවල මූලයන් පහත පරිදි බෙදා දැක්විය හැකිය :

1. පුද්ගලයන්
2. ආයතන ප්‍රධානීන් /අමාත්‍යාංශ ලේකම්වරුන්
3. ආචාර්යවරුන්
4. විශේෂඥ වෛද්‍යවරුන්, වෛද්‍ය නිලධාරීන්
5. පූජක පක්ෂය
6. ගුරුමහත්ම, මහත්මීන්

7. සමිති සමාගම්
8. විවිධ දේශපාලන පක්ෂ නායකයින්.

2015 වර්ෂයේ ලද පැමිණිලි 52 පහත දැක්වෙන පුවත්පත් අයිතිකරුවන්ට විරුද්ධව ඉදිරිපත් කර තිබුණි.

අයිතිකරුගේ නම :

1. සී.ස. එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම
2. සී.ස. උපාලි පුවත්පත් සමාගම
3. ලංකා මල්ටි පබ්ලිෂර් (පෞද්ගලික) සමාගම
4. සී.ස. විජය පුවත්පත් සමාගම
5. සුමති පුවත්පත් සමාගම
6. රිවිර පුවත්පත් ආයතනය
7. රාවය පබ්ලිෂර් ගරන්ටි ලිමිටඩ් ආයතනය
8. ඊතලය පුවත්පත් ආයතනය
9. ලීඩර් පබ්ලිකේෂන් ආයතනය
10. සිලෝන් නිව්ස් පේපර්ස් පුද්ගලික සමාගම.

සමාලෝචිත වර්ෂයට අදාළ මුළු පැමිණිලි සම්බන්ධයෙන් මණ්ඩලය තීරණ ලබා ගත් ආකාරය පහත සඳහන් පරිදි වේ:

| | |
|---|---|
| විමර්ශන කටයුතු වෙමින් පවතින | 23 |
| එකඟතාවයට පත් වූ | 04 |
| ඉදිරි කටයුතු නොකිරීමට තීරණය කළ | 16 |
| නිෂ්ප්‍රභ කිරීම | 09 |
| නියෝග | -- |
| | 52 |

ඉදිරි කටයුතු නොකිරීමට තීරණය කළ වර්ගීකරණය පහත සඳහන් නිර්නායකයන් මත පදනම් විය:

- පැමිණිල්ල පුවත්පත් මණ්ඩලීය විෂය පථයට අදාල නොවීම.
- පැමිණිලි පාර්ශ්වය නියමිත කාලයට අවශ්‍ය ලේඛන ඉදිරිපත් නොකිරීම.
- පැමිණිල්ල විභාගවන අතරතුර පැමිණිලි පාර්ශ්වය ඒ සඳහා සහභාගි නොවීම.
- පැමිණිල්ලට අදාල පුවත්පත ඒ වන විට ප්‍රකාශයට පත් නොකිරීම.
- අදාල පුවත්පත් වාර්තාවෙන් පැමිණිලිකරුට අගතියක් නොවීම.
- පැමිණිලිවලට අදාලව අධිකරණයේ නඩුවක් විභාගයට ගැනීම.

පුවත්පත් ලියාපදිංචි කිරීම

2015 වසරේ මණ්ඩලයේ ලියාපදිංචි පුවත්පත් සංඛ්‍යාව 223ක් වේ.

**04. කාර්ය මණ්ඩලය**

වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ අනුමැතියට යටත්ව සකස් කරන ලද ආකෘතියට අනුව නව බඳවා ගැනීමේ පරිපාටිය අනුව කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

2015 දෙසැම්බර් මස වන විට ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ සේවක සංඛ්‍යාව 13 කි.

| | | |
|---|---|---|
| 1. | ටී. නිරෝෂණ මහතා | සහකාර කොමසාරිස් (විමර්ශන) |
| 2. | එච්. එස්. විජේරත්න මිය | ප්‍රවෘත්ති විමර්ශක |
| 3. | ඉන්ද්‍රානි මුරුගේසු මිය | භාෂා/භාෂණ පරිවර්තිකා |
| 4. | ටී. ඒ. අනෝමා ප්‍රියන්ති තිලකරත්න මිය | පරිගණක ක්‍රියාකරු |
| 5. | ටී. එන්. නිල්මිණී පීරිස් මිය | ගිණුම් සහකාර |
| 6. | කේ. ජී. එන්. එච්. පතිරත්න මිය | කළමනාකරණ සහකාර (ලිපිකරු) |
| 7. | බී. එම්. පී. කේ. සිරිවර්ධන මිය | කළමනාකරණ සහකාර (ලිපිකරු) |
| 8. | එන්. ජේ. ඒ. ජේ. ජී. පෙරේරා මිය | කළමනාකරණ සහකාර (ලිපිකරු) |
| 9. | ඒ. එස්. තෙරංජි මිය | කළමනාකරණ සහකාර (ලිපිකරු) |
| 10. | කේ. එල්. චන්ද්‍රපාල මහතා | රියදුරු |
| 11. | ජී. බී. කරුණාතිලක මහතා | රියදුරු |

12. කේ. ජී. එල්. විජේරත්න මහතා කාර්යාල කාර්ය සහයක
13. එච්. එස්. එස්. ආනන්ද මහතා පණිවිඩකරු

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ ගණකාධිකාරී එස්. ඒ. ජගත්සිරි මහතා 2015.10.31 වැනි දින විශ්‍රාම ලබා ගත් අතර එච්. ඒ. ටී. විජේරත්න මහතා 2015.05.06 වැනි දින විශ්‍රාම ලබා ගන්නා ලදී.

**05. අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයට නිකුත් කරනු ලබන විධාන**

සමාලෝචිත කාලය තුළ ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යතුමා ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයට නියෝග නිකුත් නොකළේ ය.

**06. මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන්**

(1) පහත සඳහන් ප්‍රාදේශීය මාධ්‍යවේදී වැඩමුළු හා පාසල් මාධ්‍යවේදී වැඩමුළු 2015 වසරේ දී පවත්වන ලදී.

| **දිනය** | **වැඩමුළුව** | **සහභාගී වූ මාධ්‍යවේදීන්/ පාසල් සිසුන් සංඛ්‍යාව** | **පැවැත් වූ ස්ථානය** |
|---|---|---|---|
| 2015.09.05 | මාතලේ දිස්ත්‍රික් ප්‍රාදේශීය මාධ්‍යවේදී වැඩමුළුව | 57 | "Hotel Spring View" |
| 2015.09.16 | ජනමාධ්‍ය සඳහා නියාමනයක් අවශ්‍යද යන මාසික දේශන වැඩසටහන | 343 | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව |
| 2015.10.21 | පොළොන්නරුව පාසල් මාධ්‍ය වැඩමුළුව | 345 | පො/විලයාය මහා විද්‍යාලය |
| 2015.10.22 | පො/රාජකීය විද්‍යාලීය පාසල් මාධ්‍ය වැඩමුළුව | 402 | පො/රාජකීය විද්‍යාලය |
| 2015.12.06 | රත්නපුර දිස්ත්‍රික් ප්‍රාදේශීය මාධ්‍යවේදී වැඩමුළුව | 78 | "Hotel Centauria" |

**මාධ්‍ය අධ්‍යයනය හා පුවත්පත් කලාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - 2015 වසර**

මාධ්‍යවේදීන් 38 දෙනෙකුගේ සහභාගිත්වයෙන් ඔවුන්ගේ විෂයානුබද්ධ දැනුම වර්ධනය කිරීම අරමුණු කර පුවත්පත් කලාව හා සන්නිවේදන අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ හතරවන කණ්ඩායමේ අධ්‍යයන කටයුතු 2015.12.02 වැනි දින ආරම්භ කරන ලදී.

**සිකුරාදා දිනවල පැවැත්වෙන සන්නිවේදන කතිකාවත - 2015 වසර**

කාලීන වශයෙන් වැදගත් ප්‍රකාශනයන් ඉලක්ක කර සන්නිවේදන කතිකාවත නම් සාකච්ඡාමය වැඩසටහනක් සෑම සිකුරාදා දිනකම පස්වරුවේ පවත්වන ලදී.

08. මුදල්

i 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ පුනරාවර්තන වියදම් වෙනුවෙන් රු. 25,000,000/- ක මුදලක් ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ අනුමත කරන ලදී. මෙම මුදලින් රු. 17,410,000/-ක් මණ්ඩලයේ වියදම් සඳහා වර්ෂය තුළ දී මහා භාණ්ඩාගාරයෙන් මාසික වාරික වශයෙන් ලබා ගන්නා ලදී.

ii 2015 වර්ෂය සඳහා ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් රු. 1,000,000/- ක මුදලක් මහා භාණ්ඩාගාරයේ වැය ශීර්ෂය යටතේ අනුමත කළ අතර මෙම මුදලින් රු. 1,000,000/- ක් මණ්ඩලයේ ප්‍රාග්ධන වියදම් සඳහා ලබා ගන්නා ලදී.

iii රජයේ දායකය සහ පුවත්පත් ලියාපදිංචි කිරීමේ ගාස්තු හැරුණු විට 2015 වර්ෂය තුළදී මණ්ඩල අරමුදලට බැර කරන ලද ලැබීම් මෙසේය:

| | | |
|---|---|---|
| වෙනත් ලැබීම් | රු. | 410,742.10 |
| ප්‍රමාද ගාස්තු ආදායම් | රු. | 42,200.00 |
| | | 452,942.10 |

iv. මූල්‍ය කාර්ය සාධන වාර්තාව

පුනරාවර්තන වියදම් සඳහා රජයේ දායකය ද ඇතුළුව වර්ෂය තුළ මුළු ආදායම රු. 18,437,942.10 ක් වූ අතර මුළු වියදම රු. 19,229,783. 83 ක් විය. ආදායම් ඉක්ම වූ වියදම රු. 791,841.73 ක් 2015 වර්ෂයේ දී මණ්ඩල අරමුදලට හර කරන ලදී.

v. මණ්ඩල සමුච්චිත අරමුදල

2015 වර්ෂය ආරම්භයේ දී මණ්ඩල අරමුදලේ බැර ශේෂය රු. 3,083,709.36 කි. වර්ෂය ආරම්භයේ ප්‍රාග්ධන අරමුදලේ ශේෂය රු. 2,849,514.00 කි. වර්ෂය තුළදී ප්‍රාග්ධන වත්කම් මිලට ගැනීම සඳහා ලද මුදල රු. 1,000,000/- කි. වර්ෂය සඳහා ප්‍රාග්ධන ක්‍රමක්ෂය රු. 136,843.00 කි. මෙම වසරේ ප්‍රාග්ධන අරමුදලේ ශේෂය රු. 3,712,671/- ක් විය. වර්ෂය තුළ ආදායම ඉක්ම වූ වියදම රු. 791,841.73 ක් සහ කලින් වර්ෂයට ගැලපුම් වෙනුවෙන් රු. (125,972.10) ක් මණ්ඩල අරමුදලට මාරු කිරීමෙන් පසු වර්ෂය අවසානයේ මණ්ඩල සමුච්චිත අරමුදලේ බැර ශේෂය රු. 10,964,384. 53 ක් විය.

මණ්ඩල සමුච්චිත අරමුදලේ බැර ශේෂය ද, පාරිතෝෂික අරමුදල සඳහා වෙන්කිරීම් වන රු. 3,939,031.00/- ක් සහ ප්‍රවර්තන බැරකම් වන රු. 286,459.17 ක්ද ඇතුළුව මුළු වගකීම් ප්‍රමාණය ස්ථාවර වත්කම් වන රු. 8,491,944.47 ක්, පාරිතෝෂික, පර්යේෂණ ණය අරමුදල් හා වෙනත් තැන්පත් රු. 3,945,342.52 ක් හා ප්‍රවර්තන වත්කම් රු. 2,752,587.71 ක් මගින් නියෝජනය වේ.

vi. පුවත්පත් ලියාපදිංචි කිරීම

2015 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා පුවත්පත් ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් රු. 575,000/- ක් ලැබුණි.

09. ස්තුතිය

ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයෙන් ලැබුණු නිවැරදි උපදෙස් සහ සහයෝගය මෙන්ම වගකීම් හා යුතුකම් ඉටුකිරීමේදී ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල කාර්ය මණ්ඩලයේ සියලු දෙනා විසින් දක්වන ලද ඇපකැපවීම ද අගය කරමි.

අධිනීතිඥ කොග්ගල වෙල්ලාල බන්දුල
සභාපති

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය,
155/15, කාසල් වීදිය,
බොරැල්ල, කොළඹ 08.
2015.02.28

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය

| (සියළුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලිනි) | සටහන | 2015 | 2014 |
|---|---|---|---|
| **ආදායම** | | | |
| රජයේ ප්‍රතිපාදන | 3 | 17,410,000.00 | 18,270,000.00 |
| පොත් අලෙවියෙන් ලද කොමිස් | | - | - |
| පුවත්පත් ලියාපදිංචි ගාස්තු | | 575,000.00 | 597,500.00 |
| ඡායා පිටපත් ගාස්තු | | 6,640.00 | 6,825.00 |
| ප්‍රමාද ගාස්තු | | 42,200.00 | 121,300.00 |
| පොත් අලෙවිය | 4 | 92.77 | (109.66) |
| ඩිප්ලෝමා පාඨමාලා ආදායම | | 227,000.00 | 353,000.00 |
| පොලී ආදායම - කාර්යමණ්ඩල ණය | | 45,243.55 | 57,359.17 |
| පොලී ආදායම - ඉතුරුම් ගිණුම | | 131,765.78 | 94,613.14 |
| **මුළු ආදායම** | | **18,437,942.10** | **19,500,487.65** |
| **වියදම්** | | | |
| වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ | 5 | 10,496,159.46 | 9,106,096.84 |
| සැපයුම් සහ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය | 6 | 678,622.96 | 1,035,844.39 |
| දේපල ක්ෂයවීම්, යන්ත්‍රාගාර සහ උපකරණ | | 1,430,183.27 | 1,427,923.77 |
| උපයෝගිතා වියදම් | 7 | 3,141,219.51 | 3,160,808.22 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 8 | 1,940,047.48 | 2,114,834.66 |
| ප්‍රදාන සහ හුවමාරු ගෙවීම් | 9 | 1,543,551.15 | 4,145,946.67 |
| **මුළු වියදම්** | | **19,229,783.83** | **20,991,454.55** |
| **බදු පෙර අතිරික්තය/(හිඟය)** | | **(791,841.73)** | **(1,490,966.90)** |
| ආදායම් බදු වියදම් | | - | - |
| **වර්ෂය සඳහා අතිරික්තය/(හිඟය)** | | **(791,841.73)** | **(1,490,966.90)** |

**ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය**
**2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**
(සියළුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලිනි)

| | සටහන | 2015 | 2014 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| ජංගම වත්කම් | | | |
| මුදල් සහ මුදල් සමාන දෑ | 10 | 539,890.15 | 651,864.64 |
| ලැබිය යුතු ආදායම් | 11 | 13,370.00 | 23,962.71 |
| තොග ලේඛනය | 12 | 529,865.01 | 552,229.77 |
| උත්සව අත්තිකාරම් | | 7,500.00 | 12,000.00 |
| දේශීය මිලදී ගැණුම් සඳහා අත්තිකාරම් | | - | 10,000.00 |
| තැන්පතු සහ පූර්ව ගෙවීම් | 13 | 767,130.05 | 696,121.73 |
| ලැබිය යුතු ආපදා ණය | 14 | 894,832.50 | 1,251,206.00 |
| | | 2,752,587.71 | 3,197,384.85 |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල යන්ත්‍රාගාර සහ උපකරණ | 15 | 8,491,944.47 | 8,999,117.98 |
| ආයෝජන - ඉතුරුම් ගිණුම් (අරමුදල් වෙනුවෙන්) | 16 | 3,945,342.52 | 3,139,173.89 |
| | | 12,437,286.99 | 12,138,291.87 |
| **මුළු වත්කම්** | | 15,189,874.70 | 15,335,676.72 |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| විවිධ ණයහිමියෝ | | 5,000.00 | 2,000.00 |
| උපචිත වියදම් | 17 | 281,459.17 | 172,908.36 |
| | | 286,459.17 | 174,908.36 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| සේවක ප්‍රතිලාභ | 18 | 3,939,031.00 | 4,278,570.00 |
| | | 3,939,031.00 | 4,278,570.00 |
| **මුළු වගකීම්** | | 4,225,490.17 | 4,453,478.36 |
| **ශුද්ධ වත්කම්** | | 10,964,384.53 | 10,882,198.36 |
| **ශුද්ධ වත්කම් / කොටස් ප්‍රාග්ධනය** | | | |
| හඳුන්වාදුන් ප්‍රාග්ධනය | | | |
| රාජ්‍ය භාණ්ඩාගාරය | | 3,712,671.00 | 2,849,514.00 |
| ප්‍රාග්ධන සංචිත | | 4,115,000.00 | 4,115,000.00 |
| ප්‍රත්‍යාගනන සංචිත | | 833,975.00 | 833,975.00 |
| සමුච්චිත අතිරික්ත /(හිඟ) | | 2,302,738.53 | 3,083,709.36 |
| | | 10,964,384.53 | 10,882,198.36 |

පිටු අංක 05 සිට 16 දක්වාවූ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයෙහි අත්‍යවශ්‍ය කොටසක් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන රාජ්‍ය අංශය සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සකස් කර ඇත.

................................
**ගිණුම් සහකාර**
**ගණකාධිකාරි වෙනුවට**

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය
මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ සියළු වගකීම් අධ්‍යක්ෂ මණ්ඩලය සහ පාලක මණ්ඩලය සතුවේ.

පාලක මණ්ඩලය වෙනුවෙන් අත්සන් කළේ,

................................
**පුවත්පත් කොමසාරිස් (වැ.බ.)**
ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

................................
**සභාපති**

2015 පෙබරවාරි 19

**ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය**

**2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**වත්කම්/කොටස් ප්‍රාග්ධනයෙහි වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය**

(සියළුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලිනි)

| | දායක ප්‍රාග්ධනය | ප්‍රාග්ධන සංචිතය | ප්‍රත්‍යාගනන සංචිතය | සමුච්චිත අතිරික්ත /(හිඟය) | එකතුව |
|---|---|---|---|---|---|
| **2013 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 10,074,500.00 | 4,115,000.00 | 777,475.00 | (3,625,336.30) | 11,341,638.70 |
| ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස්කම් / වැරදි නිවැරදි කිරීම් (සටහන A ) | - | - | - | (24,973.44) | (24,973.44) |
| භාණ්ඩාගාරයෙන් ලද අරමුදල් | 1,000,000.00 | - | - | - | 1,000,000.00 |
| භාණ්ඩාගාරයට නැවත ගෙවීම් | - | - | - | - | - |
| ප්‍රාග්ධන සංචිතයට මාරුකිරීම් | - | - | - | - | - |
| රජයේ දායකය ප්‍රාග්ධන ගිණුමට බැර කිරීම ( ක්‍රම ක්ෂය සඳහා ) | (8,224,986.00) | | | 8,224,986.00 | - |
| වර්ෂය සඳහා අතිරික්ත/(හිඟය) | | | | (1,490,966.90) | (1,490,966.90) |
| **2014 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 2,849,514.00 | 4,115,000.00 | 777,475.00 | 3,083,709.36 | 10,825,698.36 |
| ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස්කම් / වැරදි නිවැරදි කිරීම් (සටහන B ) | - | - | - | (125,972.10) | (125,972.10) |
| භාණ්ඩාගාරයෙන් ලද අරමුදල් | 1,000,000.00 | - | - | - | 1,000,000.00 |
| භාණ්ඩාගාරයට නැවත ගෙවීම් | - | - | - | - | - |
| ප්‍රාග්ධන සංචිතයට මාරුකිරීම් | - | - | 56,500.00 | - | 56,500.00 |
| රජයේ දායකය ප්‍රාග්ධන ගිණුමට බැර කිරීම ( ක්‍රම ක්ෂය සඳහා ) | (136,843.00) | - | - | 136,843.00 | - |
| වර්ෂය සඳහා අතිරික්ත/(හිඟය) | - | - | - | (791,841.73) | (791,841.73) |
| **2013 දෙසැම්බර් 31 වැනි දිනට ශේෂය** | 3,712,671.00 | 4,115,000.00 | 833,975.00 | 2,302,738.53 | 10,964,384.53 |

(සම්බන්ධයි.....)

**ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය**

**2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**වත්කම්/කොටස් ප්‍රාග්ධනයෙහි වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය**

(සියළුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලිනි)

**සටහන් A - ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස්කම් / වැරදි නිවැරදි කිරීම්**

| | |
|---|---|
| වර්ෂය තුළ දී මණ්ඩල අරමුදලට පහත ගැලපුම් සිදුකර ඇත | |
| 2013 වසර සඳහා ඩිප්ලෝමා ලියාපදිංචි කිරීම් | 12,000.00 |
| වැරදි නිවැරදි කිරීම් - ක්ෂය | 48,433.33 |
| පුවත්පත් විකුණුම් | 4,816.50 |
| 2013 වසර සඳහා පත්තර ලියාපදිංචි කිරීම් | 40,250.00 |
| | **105,499.83** |
| වැරදි නිවැරදි කිරීම් - ස්ථාවර වත්කම් | (44,180.00) |
| 2012 වසරේ ටෝනර් මිලදී ගැනීම් | (34,800.00) |
| වැරදි නිවැරදි කිරීම් - පොත් තොග | (15,250.00) |
| | (25,043.27) |
| වැරදි නිවැරදි කිරීම් - ක්ෂය | (1,200.00) |
| 2012, 2013 වසර සඳහා ඩිප්ලෝමා ලියාපදිංචි කිරීම් ගාස්තු ගැලපීම | (10,000.00) |
| | (24,973.44) |

**සටහන් B - ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස්කම් / වැරදි නිවැරදි කිරීම්**

| | |
|---|---|
| වර්ෂය තුළදී මණ්ඩල අරමුදලට පහත ගැලපුම් සිදුකර ඇත | |
| වැටුප් රහිත ගෙවීම් | 573.00 |
| පුවත්පත් විකුණුම් | 2,736.50 |
| 2014 වසර සඳහා පත්තර ලියාපදිංචි කිරීම් | 11,000.00 |
| | **14,309.50** |
| ගෙවිය යුතු අනියම් වේතන | (1,500.00) |
| වැරදි නිවැරදි කිරීම් - පාරිතෝෂිත | (136,152.00) |
| වැරදි නිවැරදි කිරීම් - | (2,629.60) |
| | (125,972.10) |

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය
2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය
(සියළුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලිනි)

| | සටහන | 2015 | 2014 |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | | |
| වර්ෂය සඳහා අතිරික්තය / (හිඟය) | | (791,841.73) | (1,490,966.90) |
| **ගැලපුම්** | | | |
| ක්ෂයවීම් | | 1,430,183.27 | 1,427,923.77 |
| කපාහැරීම් | | 66,205.24 | - |
| ස්ථාවර වත්කම් හා ක්ෂයවීම් ගැලපීම | | - | 35,489.94 |
| පෙර වර්ෂයේ ගැලපුම් | | (125,972.10) | (24,973.44) |
| ප්‍රාග්ධන සංචිතයට මාරු කිරීම් | | - | 56,500.00 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්** | | | |
| පාරිතෝෂික ප්‍රතිපාදන | | (339,539.00) | 540,363.00 |
| ලැබිය යුතු ආදායම් (වැඩිවීම්) / අඩුවීම් | | 10,592.71 | 57,180.54 |
| භාණ්ඩ ලේඛනවල (වැඩිවීම්) / අඩුවීම් | | 22,364.76 | 61,400.96 |
| උත්සව අත්තිකාරම්වල (වැඩිවීම්) / අඩුවීම් | | 4,500.00 | 1,000.00 |
| දේශීය මිලදීගැනීම් සඳහා අත්තිකාරම් (වැඩිවීම්) / අඩුවීම් | | 10,000.00 | (10,000.00) |
| තැන්පතු සහ කලින් ගෙවීම් (වැඩිවීම්) / අඩුවීම් | | (71,008.32) | 16,368.34 |
| ලැබිය යුතු ආපදා ණය (වැඩිවීම්) / අඩුවීම් | | 356,373.50 | 271,823.50 |
| විවිධ ණයහිමියන්ගේ වැඩිවීම් / (අඩුවීම්) | | 3,000.00 | - |
| උපචිත වියදම්වල වැඩිවීම් / (අඩුවීම්) | | 108,550.81 | 66,086.39 |
| **මෙහෙයුම්වලින් ජනනය වූ මුදල්** | | **683,409.14** | **1,008,196.10** |
| **මෙහෙයුම්වලින් ජනනය වූ මුදල්** | | | |
| ගෙවූ පාරිතෝෂික | | 0.00 | 0.00 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **683,409.14** | **1,008,196.10** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | | |
| මිලදී ගත් ස්ථාවර වත්කම් | | (989,215.00) | (1,026,741.25) |
| අරමුදල්වල ආයෝජන | | (806,168.63) | (877,600.81) |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ගලාඒම් / (ගලායාම්)** | | **(1,795,383.63)** | **(1,904,342.06)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වල මුදල් ප්‍රවාහය** | | | |
| මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන / වෙත කරන ලද ආපසු ගෙවීම්) | | 1,000,000.00 | 1,000,000.00 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ගලාඒම් / (ගලායාම්)** | | **1,000,000.00** | **1,000,000.00** |
| **මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වර්ධනය / අඩුවීම** | | **(111,974.49)** | **103,854.04** |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ | | **651,864.64** | **548,010.60** |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ** | 10 | **539,890.15** | **651,864.64** |

පිටු අංක 06 සිට 16 දක්වා වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයෙහි අත්‍යවශ්‍ය කොටසක් වේ.

**1 සංස්ථාපනය සහ නෛතික ව්‍යුහය**

1973 අංක 5 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපිත ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය අංක 155/15, කාසල් වීදිය, බොරැල්ල, කොළඹ 08 යන ලිපිනයෙහි සිය ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන සේවා ස්ථානය පවත්වාගෙන යනු ලබයි.

**1.1 ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම්වල ස්වභාවය**

පුවත්පත් නිදහස ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධනය උදෙසා වන සංස්කෘතිකාංගයක් ලෙස ප්‍රචලිත කිරීම ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ ප්‍රමුඛතම කාර්යයයි.

**1.2 ගිණුම් වාර්තා සැකසීමේ පදනම**

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී භාවිත කළ ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පහත දක්වා ඇත. විශේෂයෙන් සඳහන් කර නොමැති නම් එම ප්‍රතිපත්තීන් ගිණුම් වාර්තා ඉදිරිපත් කර ඇති සෑම වර්ෂයකදීම භාවිත කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය (ICASL) විසින් ඒකාබද්ධව ප්‍රකාශයට පත් කරන ලද රාජ්‍ය ආයතන සඳහා වන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS) අනුව සකස් කර ඇත.

**1.3 අනුකූලතා ප්‍රකාශය**

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට(SLPSAS) අනුව සකස් කර ඇත.

**1.4 අඛණ්ඩභාවය**

මණ්ඩලයට නුදුරු අනාගතය තුළ තම මෙහෙයුම් පවත්වාගෙන යාමට අවශ්‍ය සම්පත් ඇති බවට පාලක මණ්ඩලය සෑහීමකට පත්වේ. එබැවින් අඛණ්ඩභාවය මත පදනම්ව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇත.

**1.1.2 සත්සත්දනාත්මක තොරතුරු**

ගිණුම්කරණ ප්‍රතිපත්ති ආයතනය විසින් අඛණ්ඩව භාවිත කර ඇති අතර පෙර වර්ෂයන්හි භාවිත කළ ප්‍රතිපත්ති හා අනුකූල වේ.

**1.1.3 යෝග්‍ය බව සහ සමූහනය**

සමාන අයිතම කාණ්ඩයන් මූල්‍ය ප්‍රකාශනයන්හි වෙන් වෙන්ව ඉදිරිපත් කර ඇති අතර අසමාන අයිතම හෝ කාර්යයන් අදාල වේ නම් පමණක් වෙන් වෙන්ව ඉදිරිපත් කර ඇත.

**1.1.4 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්**

භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර මූල්‍ය වර්ෂයන්හි භාවිත කළ ප්‍රතිපත්ති හා අනුකූල වේ.

**2. සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය**

පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සෑම කාල සීමාවකටම අදාල කර ගෙන ඇත.

**2.1 දේපල, යන්ත්‍ර සහ උපකරණ**

**2.1.1 හඳුනා ගැනීම සහ ප්‍රමාණනය**

මෝටර් රථ හැර සියළුම යන්ත්‍ර සහ උපකරණ සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානි සඳහා වන අගයන් අඩුකිරීමෙන් පසු දක්වා ඇත. ප්‍රත්‍යාගනන දින වන විට මෝටර් රථවල සාධාරණ අගය ඒවායේ සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිවල අගයන්ට වඩා අඩු බැවින් ඒවා ප්‍රත්‍යාගනන අගයට සටහන් කර ඇත. දේපල, යන්ත්‍ර සහ උපකරණවල පවතින අගයන් අයකරගත නොහැකි බව පෙන්නුම් කරන අවස්ථාවන්හිදී ඒවා විය හැකි හානි සඳහා සමාලෝචනය කරනු ලැබේ. සියළුම දේපල, යන්ත්‍ර සහ උපකරණ අයිතමයන් මූලිකවම පිරිවැය මත වාර්තා කර ඇත. දේපල, යන්ත්‍ර සහ උපකරණ අයිතමයන් ප්‍රත්‍යාගනනය කරන අවස්ථාවන්හිදී සම්පූර්ණ කාණ්ඩයම සාධාරණ අගය මත ප්‍රත්‍යාගනනය කර ඇත. ප්‍රත්‍යාගනනයන් නිසි පරිදි කලින් කලට සිදුකර ඇත. වත්කමක් ප්‍රත්‍යාගනනය කරන අවස්ථාවේදී පවතින අගයෙහි සිදුවන වැඩිවීමක් ඍජුවම ප්‍රත්‍යාගනන සංචිතයට බැර කරනු ලැබේ. අදාල වත්කමෙහි පූර්ව අතිරික්තය ඉක්මවන ප්‍රත්‍යාගනන හිඟයක් ප්‍රත්‍යාගනන සංචිතයේ අතිරික්තය ඉදිරියේ සටහන් කෙරෙන අතර ඕනෑම අතිරික්තයක් වියදමක් ලෙස හඳුනා ගැනේ. වත්කම් බැහැර කිරීමේදී විකුණන වත්කම්වලට අදාල ප්‍රත්‍යාගනන සංචිතයක් රඳවාගත් ඉපයුම්වලට මාරු කරනු ලැබේ. දේපල, යන්ත්‍ර සහ උපකරණවලින් තවදුරටත් ආර්ථික වාසි බලාපොරොත්තු නොවන අවස්ථාවන්හිදී එම අයිතමයන් ප්‍රතිස්ථාපනය හෝ බැහැර කිරීම මගින් ඉවත් කරනු ලැබේ. එම වත්කම ඉවත් කිරීමෙන් ලද ලාභ හෝ පාඩු අදාල වත්කම ඉවත් කළ වසරේ ආදායම් ප්‍රකාශනයෙහි ඇතුළත් කර ඇත.

**2.1.2 ක්ෂයවීම්**

නිරවුල් ඉඩම් හැර සියළුම දේපල, යන්ත්‍රාගාර සහ උපකරණ සඳහා ඒවායේ ඇස්තමේන්තුගත සඵල ආර්ථික කාලය පුරා කපා හැරෙන ලෙසට ඍජු ක්‍රමයක් භාවිතයෙන් පිරිවැය හෝ තක්සේරුව මත ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන ගණනය කර ඇත. වත්කම්වල ඇස්තමේන්තුගත සඵල කාලය පහත පරිදි වේ.

| වත්කම් වර්ගය | වසර |
|---|---|
| මෝටර් රථ - (10%) | 10 |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් - (20%) | 05 |
| කාර්යාල සහ සුග සාධන උපකරණ - (20%) | 05 |
| පුස්තකාල පොත් - (20%) | 05 |

වත්කම්වල සඵල කාලය සහ ශේෂ වටිනාකම සමාලෝචනය කෙරෙන අතර අවශ්‍ය නම් එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේ ගැලපුම් සිදු කෙරේ. මිලදී ගත් වර්ෂයේදී ක්ෂය සඳහා සම්පූර්ණයෙන් ප්‍රතිපාදන වෙන් කරන අතර බැහැර කරන වර්ෂයේදී ක්ෂය සඳහා වෙන් කිරීම් නොකෙරේ.

### 2.1.3 සුන්බුන් අගය

සුන්බුන් අගය ගණනය කරනු ලබන්නේ පිරිවැයෙන් 95%ක් අඩු කල අගයයි. (පවතින වෙළඳපල අගයෙන්)

### 2.2 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් හා මුදල් සමාන දෑ යන්නෙන් ඉක්මනින් මුදල් බවට පත් කළ හැකි සහ වටිනාකමේ වෙනස්වීම්වලට භාජනය වීම ඉතා අඩු එනම්, අතැති මුදල්, ඉල්ලුම් තැන්පතුව සහ ඉහළ ද්‍රවශීලතාවයකින් යුත් කෙටිකාලීන ආයෝජන අර්ථ නිරූපණය කෙරේ.

### 2.3 ආයෝජන

ආයෝජන ඉතුරුම් තැන්පතුවලින් සමන්විත වන අතර මෙම ආයෝජන පිරිවැය මත ගිණුම් තබා ඇත.

### 2.4 තොග ලේඛනය

තොග, ප්‍රකාශන සහ ලිපිද්‍රව්‍යවලින් සමන්විත වේ.

### 2.5 වෙනත් ලැබීම්

වෙනත් ලැබීම් ලබාගැනීමට අපේක්ෂිත වටිනාකමට සඳහන් කර ඇත. ඩිප්ලෝමා පාඨමාලාවෙන් ලැබිය යුතු මුදල් හැර වෙනත් සියළු ලැබීම් උපචිත පදනම මත ගිණුම් තබා ඇත.

### 2.6 වගකීම් සහ ප්‍රතිපාදන

අතීත සිදුවීමක් තුලින් වර්තමාන බැඳීමක් පැන නගින අවස්ථාවල සහ එය ඉටුකිරීම තුළින් ආර්ථික ප්‍රතිලාභ අන්තර්ගත සම්පත්වල ගලායාමක් බලාපොරොත්තුවන අවස්ථාවලදී ශේෂ පත්‍රය තුළ වගකීම් ඇතුළත් කෙරේ. ණයහිමියාගේ ඉල්ලීම මත හෝ ශේෂ පත්‍ර දිනයේ සිට වසරක් තුළ ගෙවා නිම කළ යුතු බැඳීම් ශේෂ පත්‍රයේ ජංගම වගකීම් ලෙස දක්වා ඇත. ශේෂ පත්‍ර දිනයේ සිට වසරකට පසු ගෙවා නිම කළ හැකි වගකීම් ජංගම නොවන වගකීම් ලෙස සලකනු ලැබේ.

සමාගමට පසුගිය සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස නෛතික හෝ අනුමිත වගකීමක් ඇති විට සහ එම වගකීම ඉටු කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ගලායාම පිළිබඳ පිළිගත හැකි ඇස්තමේන්තුවක් සිදුකළ යුතු අවස්ථාවකදී ශේෂ පත්‍රය තුළ ප්‍රතිපාදනයක් ඇතුළත් කෙරේ.

### 2.7 සේවක ප්‍රතිලාභ

### 2.7.1 නිශ්චිත දායක සැලසුම්

මණ්ඩලයේ සියළුම සේවකයන් සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලෙහි සාමාජිකයන් වන අතර මණ්ඩලය විසින් එම අරමුදල් සඳහා සේවකයන්ගේ මූලික වැටුපෙන් පිළිවෙලින් 12% ක් සහ 3% ක් වශයෙන් දායක මුදල් ගෙවනු ලැබේ.

### 2.7.2 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් ලෙස ප්‍රක්ෂේපිත ඒකක හර ක්‍රමයක් මත ගණනය කරනු ලබන පාරිතෝෂික ප්‍රතිලාභවල වර්තමාන වටිනාකම මණ්ඩලය විසින් ගණනය කරනු ලැබේ. ආයුගණක ලාභ හෝ පාඩු එම සැලසුමට දායකවන්නන්ගේ අපේක්ෂිත සාමාන්‍ය ඉතිරි වැඩ කාලයට එරෙහිව ආදායම හෝ වියදම ලෙස හඳුනා ගැනේ.

### 2.8 මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය

### 2.8.1 ආදායම් හඳුනාගැනීම

ආයතනයට ආර්ථික ප්‍රතිලාභ ගලා එන සහ ආදායම හා ඒ වෙනුවෙන් දරනු ලැබූ හෝ දැරීමට නියමිත ආශ්‍රිත පිරිවැය සත්‍ය ලෙසම ගණනය කළ හැකි අවස්ථාවන්හිදී එය ආදායමක් ලෙස හඳුනා ගැනේ. ආදායම ගණනය කිරීම ලැබූ හෝ ලැබීමට නියමිත ප්‍රතිෂ්ඨාවෙහි සාධාරණ අගය, වෙළඳ වට්ටම් සහ වෙළඳ බදු මත සිදු කෙරේ.

### 2.8.2 ශ්‍රී ලංකා රජයේ දායකත්වය

ශ්‍රී ලංකා රජයේ දායකත්වය උපචිත පදනම මත හඳුනා ගැනේ.

### 2.8.3 පොලී ආදායම

පොලී ආදායම ලාභයේදී හෝ පාඩුවේදී උපචිත වන විට ඵලදායී පොලී ක්‍රමය මගින් හඳුනා ගැනීම සිදු කෙරේ.

### 2.8.4 වෙනත් ආදායම්

වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

### 2.8.5.1 වියදම් හඳුනා ගැනීම

මණ්ඩලයේ එදිනෙදා මෙහෙයුම් කටයුතු සහ දේපල, යන්ත්‍ර සහ උපකරණ කාර්යක්ෂම තත්ත්වයෙන් නඩත්තු කිරීම සඳහා දරන ලද සියළු වියදම් මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනයෙහි ඇතුලත් කර ඇත.

### 2.8.5.2 වියදම් වර්ගීකරණය

මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේදී වියදමෙහි ස්වභාවය මත කරන වර්ගීකරණය මගින් මණ්ඩලයෙහි කාර්ය සාධන මූලිකාංග වඩා හොඳින් ඉදිරිපත් වන්නේයැයි පාලක මණ්ඩලය අදහස් කළ හෙයින් එම ක්‍රමය භාවිත කරන ලදී.

### 2.9 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී 'වක්‍ර ක්‍රමය' භාවිත කර ඇත.

### 2.10 වාර්තා කිරීමේ කාලයට පසු සිදු වූ සිදුවීම්

වාර්තා කිරීමේ කාලයට පසු සිදු වූ සිදුවීම් යනු වාර්තා කිරීමේ කාලසීමාවේ අවසන් දිනයත් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය ලැබෙන දිනයත් අතර සිදුවන යහපත් හෝ අයහපත් සිදුවීම් වේ. වාර්තා කිරීමේ කාලයට පසු සිදු වූ සිදුවීම්වල උචිත බව සලකා බලා අවශ්‍ය අවස්ථාවලදී මූල්‍ය ප්‍රකාශනයට ගැලපුම් හෝ අනාවරණය කිරීම් සිදු කර ඇත.

| මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (සම්බන්ධිත .....)<br>(සියළුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලිනි) | 2015 | 2014 |
|---|---|---|

**සටහන 3 - ශ්‍රී ලංකා රජයෙන් ලද දායකත්වය**

ශ්‍රී ලංකා රජයෙන් උපයෝගිතා සහ නඩත්තු සඳහා ලද ප්‍රතිපාදන නියෝජනය වේ.

| | 2015 | 2014 |
|---|---|---|
| **සටහන 4 - පොත් අලෙවිය** | | |
| පොත් විකුණුම් | 13,800.00 | 30,305.00 |
| අඩු කළා - ලැබියයුතු ආදායම් ගැලපීම | - | 7,505.00 |
| අඩු කළා - පොත් විකුණුම් පිරිවැය | 13,707.23 | 22,909.66 |
| | **92.77** | **(109.66)** |
| **සටහන 5 - වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ** | | |
| වැටුප් සහ වේතන | 7,511,380.59 | 6,053,177.46 |
| සේ.අ.අරමුදල් දායකත්වය | 1,042,437.59 | 728,608.82 |
| සේ.භා.අරමුදල් දායකත්වය | 208,487.54 | 145,721.75 |
| සේ.භා.අරමුදල් දායකත්වය - අධිභාර | 877.92 | - |
| අතිකාල සහ නිවාඩු දින වැටුප් | 346,627.82 | 495,614.31 |
| සාමාජික මුදල් | 348,000.00 | 552,000.00 |
| පාරිතෝෂික ප්‍රතිපාදන | 1,018,320.00 | 540,363.00 |
| විගණන කමිටු රැස්වීම් ගාස්තු | - | 60,000.00 |
| වෙනත් දීමනා | 20,028.00 | 530,611.50 |
| | **10,496,159.46** | **9,106,096.84** |
| **සටහන 6 - සැපයුම් සහ අවශ්‍යතා** | | |
| ලිපිද්‍රව්‍ය | 155,594.36 | 150,338.19 |
| ඉන්ධන සහ ලිහිසි ද්‍රව්‍ය | 450,893.35 | 604,491.10 |
| ඉන්ධන දීමනාව | - | 240,000.00 |
| කාර්යාල අවශ්‍යතා | 45,065.25 | 11,715.10 |
| වෛද්‍ය සැපයීම් | - | - |
| නිල ඇඳුම් | 20,000.00 | 16,000.00 |
| පුවත්පත් සහ වාර සඟරා | 7,070.00 | 13,300.00 |
| | **678,622.96** | **1,035,844.39** |
| **සටහන 7 - උපයෝගිතා වියදම්** | | |
| දුරකථන ගාස්තු | 304,654.20 | 267,800.31 |
| තැපැල් | 45,434.00 | 45,310.00 |
| විදුලිය | 198,044.55 | 248,912.75 |
| කාර්යාල කුලී | 2,160,000.00 | 2,160,000.00 |
| ජල ගාස්තු | 54,662.82 | 58,289.27 |
| ආරක්ෂක වියදම් | 378,423.94 | 380,495.89 |
| | **3,141,219.51** | **3,160,808.22** |

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (සම්බන්ධිත .....)

(සියළුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලිනි)

| | 2015 | 2014 |
|---|---|---|
| **සටහන 8 - වෙනත් මෙහෙයුම් වියදම්** | | |
| ප්‍රවාහන | - | - |
| ප්‍රවාහන දීමනා | - | 360,000.00 |
| ගමන් වියදම් - නිලධාරී | 83,850.00 | 44,042.00 |
| ගමන් වියදම් - සාමාජික | 58,872.00 | 92,950.00 |
| ගමන් වියදම් - විදේශීය | 106,861.62 | 141,807.25 |
| දැන්වීම් සහ ප්‍රකාශන | 318,617.18 | 133,775.60 |
| මුද්‍රණ සහ පොත් බැඳීම් | 98,945.00 | 132,537.00 |
| අළුත්වැඩියා සහ නඩත්තු | 698,911.24 | 711,185.96 |
| සංග්‍රහ වියදම් | 116,036.50 | 178,161.00 |
| කාර්යාල සහ ආගමික උත්සව වියදම් | 1,675.00 | 56,316.00 |
| කාර්යාල ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් කපාහැරීම් | 66,205.24 | - |
| විගණන ගාස්තු | 39,648.00 | 39,648.00 |
| අනියම් වියදම් | 80,395.00 | 12,086.00 |
| බැංකු ගාස්තු | 12,712.82 | 7,039.30 |
| මෝටර් රථ රක්ෂණ සහ බලපත්‍ර | 189,117.88 | 183,686.55 |
| නීති ගාස්තු | 21,600.00 | 21,600.00 |
| වෙබ්අඩවි වියදම් | 46,600.00 | - |
| ආධාර | - | - |
| | **1,940,047.48** | **2,114,834.66** |
| **සටහන 9 - ප්‍රදාන සහ මාරුකිරීම්** | | |
| පළාත් සන්නිවේදන වැඩමුළුව | 1,020,021.15 | 1,607,661.33 |
| ඩිප්ලෝමා පාඨමාලාව | 278,780.00 | 457,192.53 |
| දැයට කිරුළ වැඩසටහන | - | 1,734,092.81 |
| ප්‍රකාශන | 228,250.00 | 347,000.00 |
| පුහුණු පාඨමාලාව - නිලධාරී | 16,500.00 | - |
| | **1,543,551.15** | **4,145,946.67** |

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය
2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (සම්බන්ධිත .....)
(සියළුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලිනි)

| | 2015 | 2014 |
|---|---|---|
| **සටහන 10 - මුදල් සහ මුදල් සමාන දෑ** | | |
| බැංකුවේ මුදල් | 539,890.15 | 651,864.64 |
| | **539,890.15** | **651,864.64** |
| **සටහන 11 - වෙනත් ජංගම වත්කම්** | | |
| ලංකා පුවත් සමාගම - අළුත්වැඩියා ගාස්තු | - | 13,497.25 |
| අයවිය යුතු වේතන | - | 2,095.46 |
| ලියාපදිංචි සහ ප්‍රමාද ගාස්තු | 7,000.00 | 2,000.00 |
| පොත් අලෙවිය | 6,370.00 | 6,370.00 |
| | **13,370.00** | **23,962.71** |
| **සටහන 12 - තොග ලේඛනය** | | |
| පොත් තොග | 334,275.53 | 381,880.01 |
| ලිපිද්‍රව්‍ය තොග | 120,933.98 | 105,863.36 |
| විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත භාණ්ඩ තොග | 74,655.50 | 64,486.40 |
| | **529,865.01** | **552,229.77** |
| **සටහන 13 - තැන්පතු සහ අත්තිකාරම්** | | |
| ආරක්ෂක තැන්පතුව - කාසල් වීදිය ගොඩනැගිල්ල | 540,000.00 | 540,000.00 |
| ආරක්ෂක තැන්පතුව - ජල බෝතල් | 5,600.00 | 4,000.00 |
| ඉන්ධන තැන්පතුව | 75,000.00 | 75,000.00 |
| රක්ෂණ සහ ආදායම් සහතික ගාස්තු | 146,530.05 | 77,121.73 |
| **එකතුව** | **767,130.05** | **696,121.73** |
| **සටහන 14 - ලැබිය යුතු ආපදා ණය** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 1,251,206.00 | 1,523,029.50 |
| වර්ෂය තුළ ලබා දුන් ණය | 95,130.00 | 99,920.00 |
| | **1,346,336.00** | **1,622,949.50** |
| වර්ෂය තුළ අයකර ගත් ණය | (451,503.50) | (371,743.50) |
| **වර්ෂය අවසානයේ ශේෂය** | **894,832.50** | **1,251,206.00** |

සටහන 15 - දේපල, යන්ත්‍රාගාර සහ උපකරණ

| | මෝටර් රථ | ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | කාර්යාල සහ සුහ සාධන උපකරණ | පුස්තකාල පොත් | එකතුව |
|---|---|---|---|---|---|
| **පිරිවැය / ප්‍රත්‍යාගණනය** | | | | | |
| 2015 ජනවාරි 01 දිනට ශේෂය | 10,001,000.00 | 1,261,519.00 | 2,906,241.83 | 179,844.48 | 14,348,605.31 |
| එකතු කිරීම් | 610,000.00 | 91,260.00 | 276,030.00 | 11,925.00 | 989,215.00 |
| බැහැර කිරීම්/ කපා හැරීම් | 70,000.00 | - | 107,390.24 | - | 177,390.24 |
| **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 10,541,000.00 | 1,352,779.00 | 3,074,881.59 | 191,769.48 | 15,160,430.07 |
| **ක්ෂයවීම්** | | | | | |
| 2015 ජනවාරි 01 දිනට ශේෂය | 2,738,000.00 | 1,021,140.00 | 1,486,284.17 | 104,063.16 | 5,349,487.33 |
| වර්ෂය සඳහා | 914,000.00 | 105,100.00 | 383,585.00 | 27,498.27 | 1,430,183.27 |
| බැහැර කිරීම් මත | (6,000.00) | - | (105,185.00) | - | (111,185.00) |
| **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 3,646,000.00 | 1,126,240.00 | 1,764,684.17 | 131,561.43 | 6,668,485.60 |
| **පවතින වටිනාකම** | | | | | |
| **2015 ජනවාරි 01 දිනට** | 7,263,000.00 | 240,379.00 | 1,419,957.66 | 75,781.32 | 8,999,117.98 |
| **2015 දෙසැම්බර් 31 දිනට** | 6,895,000.00 | 226,539.00 | 1,310,197.42 | 60,208.05 | 8,491,944.47 |

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය
2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (සම්බන්ධිත .....)
(සියළුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලිනි)

| | 2015 | 2014 |
|---|---|---|
| **සටහන 16 - ආයෝජන - ඉතුරුම් ගිණුම් (අරමුදල් සඳහා)** | | |
| මහජන බැංකුව - ණය අරමුදල | 1,734,333.37 | 1,250,203.76 |
| මහජන බැංකුව - පර්යේෂණ අරමුදල | 1,507,037.66 | 1,212,556.69 |
| මහජන බැංකුව - පාරිතෝෂික අරමුදල | 703,971.49 | 676,413.44 |
| | **3,945,342.52** | **3,139,173.89** |
| **සටහන 17 - උපචිත වියදම්** | | |
| අතිකාල | 80,631.21 | 46,219.06 |
| ගමන් වියදම් දීමනා | 4,800.00 | 400.00 |
| දුරකථන | 32,081.12 | 18,973.30 |
| විගණන ගාස්තු | 145,824.00 | 106,176.00 |
| ඉන්ධන | 9,001.27 | |
| වෙනත් දීමනා | 6,000.00 | |
| සේ.භා.අරමුදල් අධිභාර | 877.92 | - |
| ජල ගාස්තු | 2,243.65 | |
| පුවත්පත් සහ වාර සඟරා | - | 1,140.00 |
| | **281,459.17** | **172,908.36** |
| **සටහන 18 - සේවක ප්‍රතිලාභ** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 4,278,570.00 | 3,738,207.00 |
| පසුගිය වර්ෂයේ ගැලපීම් | 136,152.00 | - |
| වර්ෂය තුළ ගෙවූ පාරිතෝෂික | (1,494,011.00) | - |
| | **2,920,711.00** | **3,738,207.00** |
| වර්ෂය තුළ වෙන් කිරීම් / (ඉවත් කිරීම්) | 1,018,320.00 | 540,363.00 |
| **වර්ෂය අවසානයේ ශේෂය** | **3,939,031.00** | **4,278,570.00** |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதித்திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No : එම්ජීඩී/සී/එස්එල්පීසී/1/15/එෆ් -1

ඔබේ අංකය / உமது இல / Your No.

දිනය / திகதி / Date : 2016 සැප්තැම්බර් 30 දින

සභාපති,
ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය.

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1973 අංක 5 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනතේ 20 වන වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.

අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone. +94-11-2887028-34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. +94-11-2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@sltnet.lk
Web : www.auditorgeneral.gov.lk

එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 09 ප්‍රකාරව පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්ගෙන් වඩා අඩු අගය මත වාර්තා තොග අගය කළ යුතු වුව ද, පිරිවැය රු. 74,650ක් වූ තොග රු. 69,450කට අලෙවි කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබියදී එම තොගය පිරිවැයට ගිණුම්ගත කර තිබුණි.

2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ :

(අ) ගිණුම් සටහන් අංක 2.7.2 අනුව මණ්ඩලයේ විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිලාභ වගකීමේ වර්තමාන අගය පුරෝකතන ඒකක ණය ක්‍රමය මත අගය කරන බව සඳහන් කර තිබුණ ද ඒ අනුව කටයුතු නොකර වර්ෂය අවසාන පාරිතෝෂික ප්‍රතිලාභ ගිණුමේ වැඩිවීම හෝ අඩුවීම මූල්‍ය කාර්ය සාධන වාර්තාවට ගැලපීම පමණක් සිදු කර තිබුණි.

(ආ) ප්‍රාග්ධන වියදම් සඳහා වූ රජයේ ප්‍රදාන ගිණුම් තැබීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ සහ පෙර වර්ෂ 5කට සහ 2010 වර්ෂයේ සිට 2014 වර්ෂයට අදාළව ක්‍රමක්ෂය ලෙස පිළිවෙළින් රු. 136,843ක් සහ රු. 8,224,986ක් ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට හර කර රඳවාගත් අතිරික්තතා/ඌණතා ගිණුමට බැර කර තිබුණි.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් ඉවත් කිරීමේදී අදාළ ප්‍රත්‍යාගණන සංචිත වටිනාකම රඳවාගත් ලාභයට මාරු කළ යුතු වුවද ඉවත් කරන ලද වත්කම්වලට අදාළ රු. 833,975ක සංචිත වටිනාකම රඳවාගත් ලාභයට මාරු කර නොතිබුණි.

2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසිවලට සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ :

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි අංක 880 | රජයේ මුදල් භාර ගැනීම හෝ භාරව සිටින නිලධාරීන්, රජයේ ගිණුම්වලට අදළ ගෙවීම් වවුචර සහතික කරන හා චෙක්පත් අත්සන් කරන නිලධාරීන්, ඇප ආඥාපනතට අනුකූලව ඇප තැබිය යුතු වුවත් මණ්ඩලය තුළ එවැනි රාජකාරීවල නියුතු නිලධාරීන් දෙදෙනෙකුගේ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඇප ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි අංක 102 සිට 110 දක්වා | සමාලෝචිත වර්ෂයට අදළ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව අස්ථානගත වූ හෝ පාවිච්චිකළ නොහැකි රු. 66,205ක භාණ්ඩ හඳුනාගෙන ඇතත් ඒ සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2010 මැයි 14 දිනැති අංක සීඒ/1/17/1 දරන ජනාධිපති ලේකම් කාර්යාලයේ ලිපියේ I ඡේදය | යොමුගත චක්‍රලේඛය සහ පොදු ව්‍යාපාර කාරක සභාවේ 2012 ජූලි 10 දිනැති අංක 07 නියෝගය අනුව පුවත්පත් මණ්ඩලය රජයේ ගොඩනැගිල්ලක පවත්වා ගෙන යා යුතු බව අවධාරණය කර තිබුණද මණ්ඩලය ආරම්භයේ සිට වසර 40ක පමණ කාලයක් කුලී පදනමට පෞද්ගලික ගොඩනැගිලිවල පවත්වාගෙන ගොස් තිබුණ අතර, ඒ වෙනුවෙන් 2006 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා එකතුව රු. 13,730,500ක් වැය කර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. 791,842ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 1,490,967ක් වූයෙන් ඉකුත් වර්ෂය සමග සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 699,125ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රජයේ ප්‍රදානයන් හා අනෙකුත් ආදායම් පිළිවෙළින් රු. 860,000කින් හා රු. 202,546කින් අඩුවීම හා ඊට සාපේක්ෂව පුනරාවර්තන වියදම් රු. 1,761,670කින් අඩුවීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අඛණ්ඩ මූල්‍ය ඌනතාවයක් ඇති වී තිබූ අතර එය එම වර්ෂ කිහිපය තුළම උච්චාවචනය වී තිබුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් ගැලපීමෙන් පසු 2013 වර්ෂයේදී රු. 6,704,176ක් වූ දායකත්වය සමාලෝචිත වර්ෂයේදී රු. 11,003,288ක් දක්වා සියයට 39කින් වැඩි වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

(අ) 1973 අංක 5 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනතට අනුව මණ්ඩලයේ ප්‍රධාන අරමුණු පහත දැක්වේ.

(i) පුවත්පත් නිදහස සුරක්ෂිත කිරීම, ඒ නිදහසින් අයුතු ප්‍රයෝජන ගැනීම වැළැක්වීම, සම්මත උසස් වෘත්තීය තත්ත්වයකට අනුකූලව පුවත්පත්වල ස්වරූපය ආරක්ෂා කිරීම.

(ii) පුවත්පත් විධිමත් කිරීම හා පුවත්පත් පවත්වා ගෙන යාමට අදළ කරුණු සම්බන්ධයෙන් රජයට අනුශාසනා කිරීම.

(iii) කරුණු පිළිබඳ සත්‍ය ප්‍රකාශ ප්‍රවෘත්ති ලෙස පුවත්පත්වල පළ කිරීමේ නිදහස සුරක්ෂිත කිරීම.

(iv) පුවත්පත් හා පත්‍ර කලාවේදීන් විසින් උසස් පත්‍රකලාවේදී ආචාර ධර්ම පවත්වාගෙන යනු ලැබීම ගැන වගබලා ගැනීම.

(ආ) පුවත්පත් මණ්ඩල පනතේ 15 වන වගන්තිය හා 30 (1) වගන්තිය ප්‍රකාරව පුවත්පත්වල පළවන අසභ්‍ය, අපකීර්තිමත් හා සදාචාරාත්මක නොවන ප්‍රකාශන සම්බන්ධව සොයා බලා වරදකරුවන් අධිකරණය වෙත යොමු කිරීම සඳහා මණ්ඩලය තුළ පවත්නා යාන්ත්‍රණය ප්‍රමාණවත් වී නොතිබුණු අතර එවැනි සඟරා ලියාපදිංචි වූ සඟරා ලෙස අලෙවි කළ අවස්ථා මණ්ඩලය වෙත වාර්තා වී තිබුණද, මණ්ඩලය විසින් ඒ සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) පුවත්පත් මණ්ඩල පනතේ 25 වගන්තිය ප්‍රකාරව සෑම පුවත්පතක්ම පුවත්පත් මණ්ඩලයේ ලියාපදිංචි කළ යුතු වුවත් එලෙස ලියාපදිංචි නොකර වෙළඳපළට නිකුත් කරන පුවත්පත් සම්බන්ධව අවශ්‍ය නීති රීති සම්පාදනය කිරීමට පනතේ 30වන වගන්තිය ප්‍රකාරව බලය තිබුණද, මණ්ඩලය විසින් ඒ සඳහා විධිමත් යාන්ත්‍රණයක් පිළියෙළ කර නොතිබුණි.

(ඈ) වඩා උසස් වෘත්තීය ජනමාධ්‍යවේදයක් ඇති කිරීම සඳහා ග්‍රන්ථ මුද්‍රණය හා විෂයානුබද්ධ සංකථනයක් පැවැත්වීම අරමුණු කර තිබුණ ද ඒවා ඉටු කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ දී, ප්‍රවෘත්ති පත්‍රවලට විරුද්ධව මණ්ඩලය වෙත පැමිණිලි 18ක් ලැබී තිබුණු අතර 2014 වර්ෂයේ නොවිසඳී තිබූ පැමිණිලි 34ක්ද සමඟ විසඳීමට තිබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව 52ක් විය. ඉන් පැමිණිලි 23ක් වර්ෂය අවසන් වන විටද විසඳා නොතිබුණි.

(ඊ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව, ප්‍රාදේශීය මාධ්‍යවේදී හා පාසල් ජනමාධ්‍යවේදී වැඩමුළු 13ක් පැවැත්වීම ඉලක්ක කර ගෙන රු. 2,550,000ක ප්‍රතිපාදනය කර තිබුණ ද වැඩ සටහන් 06ක් පමණක් පවත්වා ඒ සඳහා රු.1,020,021ක් වැය කර තිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය හා පුවත්පත් පැමිණිලි කොමිසම පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් සඳහා පර්යේෂණ වාර්තාවක් ඉදිරිපත් කිරීම වෙනුවෙන් ගිවිසුම පරිදි මූලික ගෙවීම රු. 200,000ක මුදලක් කැළණිය විශ්ව විද්‍යාලයේ ජන සන්නිවේදන අංශය වෙත 2015 නොවැම්බර් 24 දින වන විට ගෙවා තිබුණු අතර, සමස්ත පර්යේෂණ වාර්තාව එම ගෙවීමෙන් මාසයක් ඇතුළත මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණු නමුත් 2016 අප්‍රේල් 30 දින වන විටත් එම වාර්තාව මණ්ඩලය වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම ගෙවීම සඳහා පර්යේෂණ අරමුදල් ගිණුමේ රු. 1,507,037ක ශේෂයක් තිබියදී පුනරාවර්තන රාජ්‍ය ප්‍රදානයන් උපයෝගී කරගෙන තිබුණි.

4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ :

(අ) මණ්ඩලය වෙත පරිගණකයක් මිලදී ගැනීමේදී, ආයතනික අවශ්‍යතාවලට ගැලපෙන පිරිවිතරයන් හඳුනාගැනීමකින් තොරව මිල ගණන් කැඳවා තිබූ අතර ආයතනික අවශ්‍යතා සමඟ නොගැලපෙන බව දක්වමින් අවම මිල වූ රු. 79,000ක ලංසුව නොසලකා රු. 104,500ක පරිගණකයක් මිලදී ගැනීමට කටයුතු කර තිබුණි.

(ආ) ඵලදායී ආයුකාලය නිසි පරිදි ඇස්තමේන්තු කිරීමකින් තොරව භාවිතයෙන් ඉවත් කරන ලද ත්‍රී රෝද රථය 2014 වසරේ රු. 70,000කට ප්‍රත්‍යාගණනය කර 2015 ජනවාරි 01 දිනට ධාරණ අගය රු. 64,000ක්ව පැවතියදී 2015 දෙසැම්බර් 31 දින වන විට පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී ත්‍රී රෝද රථයක් මිලදී ගැනීම සඳහා බජාජ් ආයතනය විසින් රු. 510,850කට මිල ගණන් ඉදිරිපත් කර තිබියදී පසුව රු. 610,000කට එම ආයතනයෙන්ම මිලදීගෙන තිබුණු අතර අනුමත මිලට වඩා රු. 99,150ක් වැඩිපුර ගෙවීමට හේතු වූ කරුණු විගණනයට පැහැදිලි කර නොතිබුණි.

4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ :

(අ) පුවත්පත් මණ්ඩල පනතේ 22 වගන්තිය ප්‍රකාරව එහි විධායක නිලධාරියා වූ පුවත්පත් කොමසාරිස් තනතුරේ කටයුතු 2010 මාර්තු 31 දින සිට අමාත්‍ය මණ්ඩලයේ උපදෙස් අනුව වරින් වර අමාත්‍යාංශයේ නිර්දේශ මත පත් කරනු ලැබූ නිලධාරීන් විසින් වැඩ බැලීමේ පදනම මත ආවරණය කර තිබුණි. පූර්ණ කාලීන නිලධාරියෙකු පත් කළ යුතු මෙම තනතුර සඳහා ස්ථිරව පුද්ගලයකු පත් කිරීම සඳහා 2012 හා 2014 වර්ෂයන්හි දී පැවති පොදු ව්‍යාපාර කාරක සභාවේදී ද නියම කරනු ලැබුව ද මෙම වාර්තාවේ දිනය දක්වාම මෙම තනතුර සඳහා ස්ථිර පුද්ගලයෙකු බඳවා ගෙන නොතිබුණි.

(ආ) මණ්ඩලයේ තනතුරු 5ක් පුරප්පාඩුව පැවතුණු බැවින් ගෙවීම් වවුචර් සහතික කිරීම, ප්‍රවෘත්ති විමර්ශනය, සේවක පරිපාලනය සහ පුවත්පත් පැමිණිලි විභාග කිරීම ආදී කටයුතු නිසියාකාරව ඉටුකිරීමට අපහසු වී තිබුණු අතර 2013 වසරේ සිට ප්‍රතිපාදන අනුමත වී තිබියදී බඳවා ගැනීම් සිදුකර නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 ක්‍රියාකාරී සැලැස්ම

සමලෝචිත වර්ෂය වෙනුවෙන් මණ්ඩලය විසින් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කර තිබුණද එය කාලානුරූපීව සමාලෝචනය කර යාවත්කාලීන කර නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙළ කළ කාර්යසාධන වාර්තාව අනුව එහි සඳහන් ඉලක්කයන් සියයට 50 සිට සියයට 100 දක්වා ඉටු නොවූ අවස්ථා 06ක් තිබූ බව නිරීක්ෂණය විය.

5.2 අභ්‍යන්තර විගණනය

මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මක නොවන අතර මණ්ඩලයේ අභ්‍යන්තර විගණන කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය වෙත පවරා තිබුණ ද සමාලෝචිත වර්ෂයේ දී අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

5.3 විගණන හා කළමනාකරණ කමිටු

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 ඡේදය ප්‍රකාරව, අවම වශයෙන් කාර්තුවකට එක බැගින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

5.4 ප්‍රසම්පාදන සැලැස්ම

2006 ජනවාරි 25 දිනැති රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙළ කර තිබුණද ඒ සඳහා අමාත්‍යාංශ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

5.5 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත හා තථ්‍ය වියදම් අතර සියයට 26 සිට සියයට 70 දක්වා ප්‍රමාණාත්මක විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

5.6 නොවිසඳී ඇති විගණන ඡේද

මණ්ඩලය සම්බන්ධයෙන් 2014 ජුලි 24 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභා රැස්වීමේදී ලබාදුන් නියෝග වූ අභ්‍යන්තර විගණනය ක්‍රියාත්මක කිරීම හා විගණකාධිපති වෙත වාර්තා ඉදිරිපත් කිරීම, විධිමත් පරිදි විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සහ මණ්ඩලයේ පුරප්පාඩු වී ඇති විධායක තනතුරු සඳහා නිලධාරීන් පත් කිරීම ආදී කාර්යයන් ඉටු කර නොතිබුණි.

5.7 පාරිසරික හා සමාජ වගකීම

1981 ඔක්තෝබර් 14 දිනැති අංක 162/5 ඒ දරන අති විශේෂ ගැසට් පත්‍රය පරිදි පුවත්පත් කලාවේදීන් සඳහා වූ ආචාර ධර්ම සංග්‍රහයට අනුව දිනපතා පලවන පුවත්පත් විමර්ශනය කර බැලීම සඳහා ක්‍රමවේදයක් පැවතියද පලවන පුවත්පත් ප්‍රමාණය හා සසඳන කල විමර්ශන නිලධාරීන්ගේ අඩුවක් පැවති බැවින් සීමිත විමර්ශන වාර්තා ප්‍රමාණයක් පමණක් ඉදිරිපත් කර තිබුණි. එකී විමර්ශන වාර්තා සම්බන්ධයෙන් ද ආචාරධර්ම පිළිපැදීම පිළිබඳව අවශ්‍ය ඇගයීම් සිදුකිරීම කෙරෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රමාණවත් අවධානයක් යොමු වී නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) කාර්ය මණ්ඩල පරිපාලනය | විධායක නිලධාරි තනතුරු වැඩබැලීමේ පදනමින් ආවරණය කිරීම හා අත්‍යවශ්‍ය තනතුරු පුරප්පාඩුව පැවතීම. |
| (ආ) මිළදී ගැනීම් පාලනය | පිරිවිතර තීරණය නොකර හා ආර්ථික පිරිමැසුම්දයක බව නොසලකා මිළදී ගැනීම. |
| (ඇ) තොග පාලනය | තොග ලේඛන නඩත්තු නොකිරීම. |
| (ඈ) අභ්‍යන්තර විගණනය | අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මක නොවීම. |

එච්. එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති.